03 ජලය ස්වාභාවික සම්පතක් ලෙස

පරිසරයෙන් අපට ලැබෙන ප්‍රයෝජනවත් ද්‍රව්‍ය සිහිපත් කරන්න. ජලයට ඒ අතරින් ප්‍රමුඛ ස්ථානයක් ලැබෙනු ඇත.

ජලය (Water) යයි කියූ පමණින් ම අපේ මතකයට නැගෙන්නේ ගංගා, ඇළ, දොළ, ළිං, පොකුණු ආදිය යි. ඒවායේ අඩංගු වන්නේ ද්‍රව අවස්ථාවේ පවතින ජලයයි. ජලය සැමවිට ම පවතින්නේ ද්‍රව අවස්ථාවේ පමණක් ද ? ඒ පිළිබඳව සොයා බැලීමට පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි නිරත වෙමු.

ක්‍රියාකාරකම 3.1

ජලය පවතින අවස්ථා හඳුනාගැනීම

අවශ්‍ය ද්‍රව්‍ය :- කුඩා අයිස් කැට කිහිපයක්, කැකෑරුම් නළයක්, දාහකයක්.

ක්‍රමය :-

- කුඩා අයිස් කැට කිහිපයක් කැකෑරුම් නළයකට දමන්න.
- රූප සටහනේ පෙනෙන පරිදි දාහකයක් භාවිතයෙන් අයිස් කැට සහිත කැකෑරුම් නළය රත් කරන්න.
- ඔබේ නිරීක්ෂණ වාර්තා කරන්න.
- එම නිරීක්ෂණවලට අනුව එළඹිය හැකි නිගමන මොනවා ද ?



3.1 රූපය

රත් කිරීමේ දී අයිස් ද්‍රව ජලය බවට පත්වන බවත්, තවදුරටත් රත්කිරීමේ දී ද්‍රව ජලය, ජල වාෂ්ප බවටත් පත්වන බව ඉහත ක්‍රියාකාරකමෙහි දී නිරීක්ෂණය කළ හැකි ය. මේ අනුව ජලය, අයිස්, ද්‍රව ජලය හා ජල වාෂ්ප ලෙස පිළිවෙලින් ඝන, ද්‍රව හා වායු යන භෞතික අවස්ථා තුනෙහි ම පවතින බව පැහැදිලි ය.

අයිස් (ඝන) → ද්‍රව ජලය (ද්‍රව) → ජල වාෂ්ප (වායු)



3.2 රූපය ▲ ජලයේ විවිධ අවස්ථා

3.1 භෞතික අවස්ථා අනුව ජලය වර්ග කිරීම

ස්වාභාවික පරිසරයෙහි ඝන, ද්‍රව හා වායු අවස්ථාවල පවතින ජලය දක්නට ලැබේ.

ඝන අවස්ථාවේ පවතින ජලය

ජලයේ ඝන අවස්ථාව සඳහා අයිස්, හිම හා ග්ලැසියර් උදාහරණ වේ. ධ්‍රැවාසන්න පෙදෙස්වල ග්ලැසියර් ලෙස පවතින්නේ ඝන අවස්ථාවේ ඇති ජලයයි. ඇතැම් රටවල ශීත කාලයේ දී හිම ලෙස පවතින්නේ ද ඝන අවස්ථාවේ ඇති ජලයයි.

ග්ලැසියර්

අයිස්

හිම

3.3 රූපය ▲ ඝන අවස්ථාවේ පවතින ජලය

ද්‍රව අවස්ථාවේ පවතින ජලය

ඇල දොළ, ගංගා, වැව්, පොකුණු, ළිං, සාගර හා මුහුදු තුළ ද්‍රව අවස්ථාවේ ඇති ජලය දැකගත හැකි ය. අපි බොහෝ විට ජලය ලෙස ව්‍යවහාර කරනු ලබන්නේ ද්‍රව අවස්ථාවේ පවතින ජලයටයි.

ගංගාව

ළිඳ

මුහුද

වැව

3.4 රූපය ▲ ද්‍රව අවස්ථාවේ පවතින ජලය

වායු අවස්ථාවේ ඇති ජලය

ජල වාෂ්ප හා හුමාලය වායු අවස්ථාවේ පවතින ජලය සඳහා උදාහරණ වේ. වායුගෝලය තුළ ජලය පවතින්නේ ජල වාෂ්ප ලෙසයි.

වායුගෝලයේ ජල වාෂ්ප පවතීදැයි සොයා බැලීමට පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි නියැලෙමු.

ක්‍රියාකාරකම 3.2

වායුගෝලයේ ජල වාෂ්ප පවතීදැයි පරීක්ෂා කිරීම.

අවශ්‍ය ද්‍රව්‍ය :- වීදුරුවක්, අයිස් කැට කිහිපයක්, ජලය හා කාඩ්බෝඩ් කැබැල්ලක්

ක්‍රමය :-

- වීදුරුවට අඩක් පමණ වන සේ ජලය දමන්න.
- මද වේලාවකට පසු පිටත පෘෂ්ඨය නිරීක්ෂණය කරන්න.
- එම ජල වීදුරුවට ම අයිස් කැට කිහිපයක් එකතු කරන්න.
- වීදුරුව කාඩ්බෝඩ් කැබැල්ලකින් වසන්න.
- මද වේලාවකට පසු පිටත පෘෂ්ඨය නිරීක්ෂණය කරන්න.
- ඔබේ නිරීක්ෂණ වාර්තා කරන්න.
- නිරීක්ෂණ ඇසුරින් එළඹිය හැකි නිගමන මොනවා ද ?



3.5 රූපය

වායුගෝලයේ ඇති ජල වාෂ්ප ඝනීභවනය වී වීදුරුවේ පිටත පෘෂ්ඨය මත තැන්පත් වී ඇති අයුරු නිරීක්ෂණය කළ හැකි ය. මේ අනුව වායුගෝලයේ ජල වාෂ්ප පවතින බව නිගමනය කළ හැකි වේ.

3.2 ජලය පවතින විවිධ ආකාර.

වර්ෂාවක දී පොළොවට පතිත වන ජල බිංදුවලට කුමක් සිදුවේ ද? ඒවා පොළොව මත ගලා යන ආකාරයත්, පොළොවට උරාගන්නා ආකාරයත්, කුහර තුළ එක් රැස්වන ආකාරයත් ඔබ දැක ඇති. වර්ෂාවක දී පොළොව මතුපිටට වැටෙන ජලයේ හැසිරීම නිරීක්ෂණය කිරීම සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි යෙදෙමු.

ක්‍රියාකාරකම 3.3

වර්ෂාවකදී පොළොවට පතිත වන ජලයෙහි හැසිරීම නිරීක්ෂණය කිරීම.

අවශ්‍ය ද්‍රව්‍ය :- වීදුරුවලින් තනා ඇති ටැංකියක්. මැටි, වැලි, ගල්, බොරළු වැනි පස්වල අඩංගු සංඝටක, කුඩා සිදුරු සහිත බඳුනක්

ක්‍රමය :-

- රූපයේ දක්වා ඇති පරිදි පසෙහි අඩංගු සංඝටක වීදුරු ටැංකිය තුළ පිළිවෙළින් සකස් කරන්න.
- සිදුරු සහිත බඳුනකට ජලය දමා රූප සටහනේ පෙනෙන පරිදි පස් මතට වැටීමට සලස්වන්න.
- ජලය ගමන් කරන අයුරු නිරීක්ෂණය කරන්න.
- නිරීක්ෂණය ඇසුරෙන් එළඹිය හැකි නිගමන මොනවාද ?



3.6 රූපය

මෙහි දී සිදුරු සහිත ටින් බඳුනෙන් පස් මතට පතිත වන ජලය වර්ෂණය ලෙස දැක්විය හැකි ය. පොළොවට පතිත වූ ජලය පසේ සංඝටක හරහා පහළට ගමන් කර වැලි, බොරලු, ගල් අතර රැඳී ඇති අතර එම ජලය භූගත ජලය ලෙස සැලකිය හැකි ය. පසෙහි මතුපිට රැඳී ඇති ජලය මතුපිට ජලය ලෙස දැක්විය හැකි ය.

මේ අනුව ජලය පවතින ආකාර ලෙස **වර්ෂණය (Precipitation)**, **මතුපිට ජලය (Surface water)** හා **භූගත ජලය (Ground water)** හැඳින්විය හැකි ය.

වර්ෂණය

වර්ෂාව, හිම, හිම කැට වැස්ස, අයිස් කැට වැස්ස ලෙසින් වර්ෂණය විවිධ ස්වරූපයෙන් ස්වාභාවික පරිසරයේ දී ඇතිවිය හැකි ය.

මතුපිට ජලය

සාගර, මුහුදු, ගංගා ඇළ දොළ, වැව්, පොකුණු, විල්, දියඇලි ආදියෙහි එක් රැස් වී ඇති ජලය මතු පිට ජලය ලෙස හැඳින්විය හැකි ය.

භූගත ජලය

ළිංවලින් හා උල්පත්වලින් අපට ලැබෙනුයේ භූගත ජලයයි.

3.3 ලවණතාව අනුව ජලය වර්ග කිරීම.

මුහුදු ජලය ලුණු රසයෙන් යුක්ත බව ඔබ දැනටමත් දන්නා කරුණකි. මුහුදු ජලය ලුණු රසවීමට හේතුව ඔබ සොයා බලා තිබේ ද ?

විවිධ ද්‍රව්‍ය ජලයෙහි දියවීම ජලය සතු විශේෂ ගුණයකි. මුහුදු ජලයෙහි විවිධ ද්‍රව්‍ය රැසක් දියවී තිබේ. මුහුදු ජලය ලුණු රසවීමට හේතුව එහි සෝඩියම් ක්ලෝරයිඩ් නම් ලවණය දියවී තිබීමයි. **දිය වී ඇති ලවණ ප්‍රමාණය එම ජලයේ ලවණතාව ලෙස හැඳින්වේ. ලවණතාව පදනම් කරගෙන ජලය, මිරිදිය (Fresh water), කිවුල්දිය (Brakish water) හා කරදිය (Marine water) ලෙස වර්ග තුනකට බෙදා ඇත.**

ලුණු ලේවා තුළදී මුහුදු ජලය වාෂ්පීභවනය කර ලුණු (සෝඩියම් ක්ලෝරයිඩ්) නිපදවයි.

මිරිදිය

ළිං, පොකුණු, ගංගා, ඇළ දොළ හා දියඇලි ආදියෙහි ඇති ජලය මිරිදිය ලෙස හැඳින්වේ. මේවායේ දිය වී ඇති ලවණ ප්‍රමාණය ඉතා ස්වල්පයකි.

කරදිය

කරදිය ලෙස සලකන්නේ මුහුදු හා සාගරවල ඇති ජලයයි. කරදියෙහි දිය වී ඇති ලවණ ප්‍රමාණය අධික ය.

කිවුල්දිය

කලපුවල ඇති ජලය කිවුල් ජලය ලෙස හැඳින්වේ. මේවායේ දියවී ඇති ලවණ ප්‍රමාණය කරදියේ තරම් නොවුණ ද මිරිදියට වඩා වැඩි ය.

මිරිදිය (ගංගාව)

කරදිය (සාගරය)

කිවුල්දිය (කලපුව)

3.7 රූපය ▲ ලවණතාව අනුව ජලය වර්ග කිරීම.

ජලයේ ලවණතාව පරීක්ෂා කිරීමට පහත දැක්වෙන ක්‍රියාකාරකමෙහි නියැලෙමු.

ක්‍රියාකාරකම 3.4

ජලයේ ලවණතාව පරීක්ෂා කිරීම

අවශ්‍ය ද්‍රව්‍ය :- ලුණු 10 g ක් පමණ, සාමාන්‍ය ජලය, 50 ml බීකරයක්, තෙදඬු තුලාවක්

ක්‍රමය :-

- 50 ml බීකරයක් ගෙන එයට ජලය 25 ml දමා ස්කන්ධය මැන සටහන් කරන්න.
- එම බීකරයේ ජලය ඉවත්කර ලුණු 2 g එක්කර ජලය ස්වල්පයක් යොදා හොඳින් දියකර 25 ml දක්වා ජලය එකතුකර නැවත ස්කන්ධය මැන සටහන් කරන්න.
- එම ලුණු ද්‍රාවණය ඉවත් කරන්න.
- නැවත එම බීකරයට ලුණු 6 g එක් කර ජලය ස්වල්පයක් යොදා හොඳින් දිය කරන්න. 25 ml දක්වා ජලය එකතුකර ස්කන්ධය මැන සටහන් කරන්න.
- ඉහත අවස්ථා තුනේදී ම ලබාගත් පාඨාංක වගුගත කරන්න.

අවස්ථාව	ස්කන්ධය (g)
ජලය හා බීකරය	
ලුණු 2 g දියකළ ජලය හා බීකරය	
ලුණු 6 g දියකළ ජලය හා බීකරය	

- පාඨාංක ඇසුරින් ඔබට එළඹිය හැකි නිගමනය කුමක් ද ?

මෙහි දී ලුණු දිය නොකළ ජලය මිරිදිය ලෙසත්, ලුණු 2 g දියකළ ජලය කිවුල්දිය ලෙසත්, ලුණු 6 g දිය කළ ජලය කරදිය ලෙසත්, උපකල්පනය කරනු ලැබේ. ලුණු වැඩි ප්‍රමාණයක් දිය වූ ජලයේ ස්කන්ධය වැඩි අගයක් ගන්නා බව ඔබට නිරීක්ෂණය කළ හැකි වේ. මේ අනුව සමාන පරිමාවක ස්කන්ධය සැලකූ විට ලවණතාව වැඩි ජලයේ ස්කන්ධය වැඩි බව නිගමනය කළ හැකි ය. මෙය පදනම් කරගෙන මිරිදිය, කරදිය හා කිවුල් දිය වෙන්කර හඳුනාගැනීම සිදුකළ හැකි ය.

පැවරුම 3.1

ඔබට අවස්ථාවක් ලද විටක කරදිය / කිවුල් දිය නියැදි සපයා ගෙන, මිරිදියෙහි ස්කන්ධ සමඟ ඒවායේ ස්කන්ධය සසඳා බැලීමට පරීක්ෂණයක් සැලසුම් කර අත්හදා බලා වාර්තා කරන්න.

3.4 ජලය වැදගත් වන ආකාර

මානව ක්‍රියාකාරකම් සඳහා ජලයේ වැදගත්කම

ජීවයේ පැවැත්ම සඳහා මෙන් ම, බොහෝ මිනිස් ක්‍රියාකාරකම් සඳහා ද ජලය අත්‍යවශ්‍ය සාධකයකි. උදෑසන සිට රාත්‍රී නින්දට යන තුරුම ඔබ කොතරම් වාර ගණනක් ජලය භාවිතයට යොමු වේ ද යන්න මදක් සිතා බලන්න.

පැවරුම 3.2

ජලයේ විවිධ වූ භාවිත අවස්ථා පිළිබඳ ව සොයා බලන්න. එම අවස්ථා නිර්මාණාත්මක ලෙස චිත්‍රයකින් හෝ පෝස්ටරයකින් හෝ ඡායාරූප එකතුවක් ලෙස හෝ ඉදිරිපත් කරන්න.

බීමට

වගා කටයුතුවලට

රෙදි සේදීමට

නෑමට

ගමනා ගමනයට

ජල විදුලිය නිපදවීමට

3.8 රූපය ▲ ජලයේ විවිධ භාවිත කිහිපයක්

ඔබ විසින් ඉහත 3.2 පැවරුමේ ඉදිරිපත් කළ ජලයේ විවිධ භාවිත පහත ක්ෂේත්‍ර යටතේ ලැයිස්තු ගත කරන්න.

1. කෘෂිකර්මාන්තය ඇතුළු විවිධ කර්මාන්ත සඳහා
2. සනීපාරක්ෂක කටයුතු සඳහා
3. ගෘහස්ථ කටයුතු සඳහා
4. ප්‍රවාහන මාධ්‍යයක් ලෙස
5. විනෝදාස්වාදය සඳහා
6. ජල ක්‍රීඩා සඳහා

ජීවයේ පැවැත්ම සඳහා ජලයේ වැදගත්කම

අධික ලෙස පාචනය වැළඳුන අවස්ථාවක දී ශරීරයෙන් ජලය ඉවත් වීමෙන් ශරීරය විජලනය වී මරණයට වුව ද පත්විය හැකි ය. ශාකයක් ජලය නොමැති වීමෙන් මැලවී යයි. දිගටම ජලය නොලැබී ගියහොත් ශාකය මිය යයි. මේ අනුව ජීවීන්ට සිය ජීවිතය පවත්වා ගෙනයාම සඳහා ජලය මූලික සාධකයක් බව ඔබට වැටහෙනු ඇත.

ජලය ජීවයේ පැවැත්මට දායක වන ආකාර කිහිපයක් පහත සටහනේ දක්වේ.



3.5 ජලය සීමිත සම්පතකි

සොබාදහමෙන් අපට දයාද කළ ප්‍රයෝජනවත් බොහෝ දෑ ඇත. ඒවා ස්වාභාවික සම්පත් වශයෙන් හැඳින්වේ. ඒ අතර ජලයට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. එහෙත් ජලය සීමිත ස්වාභාවික සම්පතකි. එයට හේතුව වන්නේ ජල ප්‍රභව බොහොමයක් සෘජුව ම පරිභෝජනය කළ නොහැකි ආකාරයට පැවතීමයි.

පෘථිවි පෘෂ්ඨයෙන් 70% කටත් වඩා ජලයෙන් වැසී ඇත. නමුත් ඉන් පරිභෝජනයට ගත හැකි ජලය ඇත්තේ 0.01% වැනි සුළු ප්‍රමාණයකි.



3.9 රූපය ▲ පෘථිවි පෘෂ්ඨයේ ඇති ජලය

ජලය සීමිත සම්පතක් වුව ද අප බොහෝ විට එය පරිහරණය කරනුයේ නොසැලකිලිමත් ලෙස ය. අප විසින් දිනකට කොපමණ ජල ප්‍රමාණයක් අපතේ හරින්නේ ද යි විමසිලිමත් වුවහොත් ඔබට එය වැටහෙනු ඇත.

පැවරුම 3.3

නිවසේ දී හා පාසලේ දී ජලය අපතේ යා හැකි අවස්ථා හඳුනාගන්න. ජලය අපතේ යාම අවම කරගත හැකි ආකාර හඳුනාගෙන පහත දක්වෙන පරිදි වගුගත කරන්න.

ජලය අපතේ යන අවස්ථා	ජලය අපතේ යාම අවම කරගත හැකි ආකාර

ජල දූෂණය

විවිධ අපද්‍රව්‍ය එකතුවීම නිසා, දුගඳ හමන, වර්ණය වෙනස් වී ඇති ජල ප්‍රභව ඔබ දැක ඇත. එලෙස ජීවීන්ගේ පරිභෝජනයට නුසුදුසු මට්ටමට ජලයට දූෂක එකතුවීම ජල දූෂණය ලෙස හැඳින්වේ. සීමිත සම්පතක් වන ජලය මිනිසාගේ නොදැනුවත්කම හා අදූරදර්ශී ක්‍රියා හේතුවෙන් දූෂණය වෙමින් පවතී.

3.10 රූපය ▲ දූෂිත ජලය සහිත ගංගාවක්

පැවරුම 3.4

ජල දූෂණයට හේතුවන මිනිස් ක්‍රියාකාරකම් ඔබ දැක ඇත. ඒ පිළිබඳ වාර්තාවක් සකස් කරන්න.

ජලය දූෂණය වන ආකාර කිහිපයක් පහත සටහනේ දැක්වේ.



කර්මාන්තශාලාවල අපද්‍රව්‍ය හා අපිරිසිදු ජලය ජලාශවලට මුදා හැරීම

ගෘහස්ථ කැලි කසළ ජලයට මුදා හැරීම

පොලිතින් හා ප්ලාස්ටික් ජලයට මුදා හැරීම



රසායනික ද්‍රව්‍ය හා විවිධ සේදුම් ද්‍රව්‍ය (ක්ෂාලක) ජලයට මුදාහැරීම

3.11 රූපය ▲ ජලය දූෂණය වන ආකාර කිහිපයක්

මතුපිට ජලය දූෂණය වීම භූගත ජලය දූෂණය වීමට ද හේතුවේ.

මතුපිට ජලයට එකතු වන විෂ රසායන ද්‍රව්‍ය, භූගත ජලයට ද එකතු වේ. භූගත ජලය පානීය ජලය ලෙස බහුලව භාවිත වන බැවින් මෙම අහිතකර ද්‍රව්‍ය ජලය හරහා ශරීරගත වේ. මේවා වකුගඩු රෝග, පිළිකා ආදී දරුණු රෝග රැසකට හේතු විය හැකි ය.

ජල දූෂණය අවම කිරීමට කඩිනම් පිළියම් නොගතහොත් පරිභෝජනයට ගත හැකි ජල ප්‍රමාණය වන 0.01% ක තරම් ප්‍රමාණය ද අපට අහිමි විය හැකි ය. මේ පිළිබඳ ව ක්‍රියා මාර්ග ගැනීමට අප සියලු දෙනා කටයුතු කිරීම කාලීන අවශ්‍යතාවකි.

සාරාංශය

- ජීවයේ පැවැත්ම සඳහා ජලය අත්‍යවශ්‍ය සාධකයකි.
- ජලය ඝන, ද්‍රව හා වායු යන භෞතික අවස්ථා තුනෙහි ම පවතී.
- ඝන අවස්ථාවේ පවතින ජලය අයිස් ලෙසත්, ද්‍රව අවස්ථාවේ පවතින ජලය ද්‍රව ජලය ලෙසත්, වාෂ්ප අවස්ථාවේ පවතින ජලය ජල වාෂ්ප ලෙසත් හැඳින්වේ.
- ජලය පවතින විවිධ ආකාර ලෙස වර්ෂණය, මතුපිට ජලය හා භූගත ජලය දැක්විය හැකි ය.
- ලවණතාව පදනම් කරගෙන මිරිදිය, කරදිය හා කිවුල්දිය ලෙස ජලය වර්ග කරනු ලැබේ.
- විවිධ මානව ක්‍රියාකාරකම් සඳහා ජලය ඉතා වැදගත් ය.
- ජල දූෂණය හේතු කොට ගෙන පරිභෝජනයට ගත හැකි ජල ප්‍රමාණය සීමිත වී ඇත.
- ජල දූෂණය අවම කර, ජල සම්පත රැක ගැනීම අප සැමගේ යුතුකමකි.

අභ්‍යාස

01. දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරන්න.

i) ජලයේ ඝන අවස්ථාව සඳහා උදහරණයක් නොවන්නේ, පහත ඒවායින් කුමක් ද ?

1. අයිස් 2. හිම 3. ග්ලැසියර 4. භූමාලය

ii) ලවණතාව අධික ජලය හඳුන්වන්නේ කුමන නමින් ද ?

1. කරදිය 2. මිරිදිය 3. කිවුල්දිය 4. බොරදිය

iii) පෘථිවියේ පවතින පරිභෝජනයට ගත හැකි ජලය ප්‍රතිශතය

1. 10% පමණි. 2. 1% පමණි. 3. 0.1% පමණි. 4. 0.01% පමණි.

iv) කලපුවල ඇති ජලය හඳුන්වන්නේ කුමන නමින් ද ?

1. කරදිය 2. මිරිදිය 3. කිවුල්දිය 4. බොරදිය

02. සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

i) ගංගා, වැව්, ඇළ දොළවල අඩංගු ජලය .... ලෙස හැඳින්වේ.

ii) කිවුල්දිය අඩංගු වන්නේ .... තුළ ය.

iii) වර්ෂාව, හිම කැට වැස්ස ආදිය .... ආකාර වේ.

iv) මුහුදු ජලයෙහි .... වර්ග රැසක් දියවී ඇත.

ව්‍යාපෘති

- පාසැලේදී ජලය අපතේ යන අවස්ථා හඳුනාගන්න. ජලය අපතේ යාම අවම කරගැනීමට යොමු කෙරෙන පණිවිඩයක් සහිත පෝස්ටර නිර්මාණය කරන්න. එම පෝස්ටර පාසැලේ ප්‍රදර්ශනය කරන්න.
- පුද්ගලයෙකුගේ දෛනික ජල පරිභෝජනය මිනුම් කර වාර්තාවක් සකස් කරන්න.
- නිවෙසක දෛනික ජල පරිභෝජනය මිනුම් කර වාර්තාවක් සකස් කරන්න.
- ජලාශයක ජලය දූෂණය වන ආකාර සොයා බලා වාර්තාවක් සකස් කරන්න.

පාරිභාෂික වචන

මිරිදිය	Fresh Water	අයිස්කැට වැස්ස	Sleet
කිවුල්දිය	Brakish Water	හිම	Snow
කරදිය	Marine Water	හිම කැට වැස්ස	Hail
භූගත ජලය	Ground Water	ජල දූෂණය	Water Pollution
මතුපිට ජලය	Surface Water	වර්ෂණය	Precipitation
ජල වාෂ්ප	Water Vapour	වර්ෂාව	Rain